# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1098 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 04/07/2024 පැය 1955

# මාධ්‍ය නිවේදනය

## පොලිස් මධ්‍යම සුභ සාධක සංගමයේ යහසාධක යෝජනා ක්‍රමයට වසර 50ක් පිරීම නිමිත්තෙන් පැවති සැමරුම් උත්සවය.

1974 වසරේ ජූනි මස ආරම්භ කර ඇති ශ්‍රී ලංකා පොලිස් මධ්‍යම සුභසාධක සංගමයේ යහසාධක යෝජනා ක්‍රමය මෙම වසරට, එනම් 2024 වර්ෂයට වසර 50 ක් සපිරීම නිමිත්තෙන් සංවිධානය කල සැමරුම් උත්සවයක් පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.07.04 වන අද දින උදෑසන නාරාහේන්පිට පොලිස් රෝහල් පරිශ්‍රයේදී පැවැත්විනි.

පොලිස් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන පොලිස් නිලධරයන් සහ නිලධරයන්ගේ ඥාතීන් මූලික කර ගනිමින් මෙම සැමරුම් උත්සවය පැවැත්වූ අතර ප්‍රථමයෙන් පොලිස්පතිතුමා විසින් පොලිස් මධ්‍යම සුභසාධක සංගමයේ යහසාධක යෝජනා ක්‍රමයේ නිර්මාතෘ කන්දයියා මහතාගේ පිළිරුවට පුෂ්ප උපහාර දැක්විය.

අනතුරුව මෙම යහසාධක යෝජනා ක්‍රමය මගින් ප්‍රතිලාභ ලබන පාර්ශව කිහිපයක් සංකේතවත් කරමින් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ නිලධරයන්ගේ දරුවන් පස් දෙනෙකු සඳහා මූල්‍යමය චෙක්පත් ලබාදීම, විශ්‍රාමික පොලිස් නිලධරයන් පස් දෙනෙකු සඳහා මූල්‍යමය චෙක්පත් ලබාදීම සහ ශ්‍රී ලංකා පොලිසියේ කැපකරු මාපිය ක්‍රමය ආරම්භ කරමින් දෙමාපිය දෙදෙනාම මියගොස් ඇති දරුවන් දෙදෙනෙකුට සංකේතාත්මකව මූල්‍යමය ආධාර ලබාදීම පොලිස්පතිතුමා විසින් සිදුකරන ලදී.

මෙම අවස්ථාව සඳහා පොලිස් මධ්‍යම සුභ සාධක සංගමයේ විධායක කමිටු සභාපති අපරාධ සහ රථවාහන දිසාව භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු මහතා, සහයක සේවා භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජිත ශ්‍රී දමින්ද මහතා, සුභ සාධක දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති පද්මිණී වීරසූරිය මහත්මිය, ජොෂ්ඨ පොලිස් නිලධරයන්, පොලිස් රෝහල් කාර්ය මණ්ඩලය, මධ්‍යම සුභසාධක සංගමයේ ලේකම් උප පොලිස් පරීක්ෂක නිමල් අබේසිංහ මහතා හා විධායක කමිටු සාමාජිකයින්ද සහභාගී විය.

සැමරුම් උත්සවයට අදාල ජායාරූප කිහිපයක්

















**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**